International Labour Organization

# සාධාරණ සංක්‍රාන්තිය

# හරිත රැකියා




**1.** දේශගුණික විපර්යාස, පරිසර දූෂණය සහ ජෛව විවිධත්වය පහත වැටීම වැනි තීරණාත්මක පාරිසරික අභියෝගවලට මුහුණ දීමේදී, වඩාත් පරිසර හිතකාමී, ඔරොත්තු දෙන සහ අවම දේශගුණික බලපෑමක් සහිත ආර්ථිකයන් සහ සමාජයන් වෙත ජාතීන් සහ ව්‍යවසායන් සංක්‍රමණය විය යුතුය.

**2.** සාධාරණ සංක්‍රාන්තියක් යනු, සාධාරණ හා සියලු දෙනා ඇතුළත් වන පරිදි ආර්ථිකය හරිතකරණය කිරීම, සුනිසි රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ එම ක්‍රියාවලියේදී කිසිවෙකු අත්නොහැරීමයි.

**3.** සාධාරණ සංක්‍රාන්තියක් මගින්, දේශගුණික ක්‍රියාකාරකම්වලින් ආර්ථික අවස්ථා නිර්මාණය වීම උපරිම කරයි. අභියෝග අවම කරමින් කළමනාකරණය කරයි. එය සිදුකරන්නේ, බලපෑමට ලක් වූ සියලුම පාර්ශ්වකරුවන් අතර ඵලදායී සමාජ සංවාදයක් මගින් වන අතර. මූලික කම්කරු මූලධර්ම සහ අයිතිවාසිකම්වලට ගරු කරමින් ය.

**4.** සාධාරණ සංක්‍රාන්තියක් සහතික කිරීම, බලශක්ති සැපයුම් දාමයට පමණක් සීමා නොවන අතර, එය සියලු රටවලට, ඕනෑම සංවර්ධන මට්ටමක පවතින ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන්ට මෙන්ම සියලු ආර්ථික ක්ෂේත්‍ර සඳහා වැදගත් වේ.

**5.** සාධාරණ සංක්‍රාන්තියක් යනු, සියලු අංශ සමාන ලෙස ප්‍රවර්ධනය වන අන්දමින් දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් පිළියම් යෙදීමේ ක්‍රියාවලියක් සහ ඉලක්කයකි. එම අංශ වන්නේ, රැකියා උත්පාදනය, සමාජ සාධාරණත්වය මෙන් ම සේවා නියුක්තිකයන්, ව්‍යවසායන් සහ ප්‍රජාවන් සඳහා සමාන පදනමක් මත සංක්‍රාන්තිය සඳහා සාධාරණ අවස්ථා සැලසීම වේ.

**6.** හරිතාගාර වායු විමෝචනය සීමා කිරීම, අපද්‍රව්‍ය හා පරිසර දූෂණය අවම කිරීම, පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම, බලශක්ති සහ අමුද්‍රව්‍ය භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මෙන් ම දේශගුණික විපර්යාසවල බලපෑම්වලට අනුවර්තනය වීමට සහාය වීම සඳහා හරිත රැකියා උපකාර වෙයි.

**7.** කෘෂිකර්මාන්තය, නිෂ්පාදනය සහ බලශක්තිය වැනි අංශ හරහා පරිසරය සංරක්ෂණය සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමට හරිත රැකියා මගින් දිරිගන්වයි.

**8.** සුනිසි රැකියා යනු, හරිත හා සාධාරණ සංක්‍රාන්තියක ප්‍රධාන ප්‍රතිලාභයකි. සේවා ස්ථානයන්හි වෘත්තීය ස්වස්ථතාව සහ සෞඛ්‍යය (OSH) වැඩිදියුණු කිරීමට හේතුවන, පරිසර හිතකාමී නිෂ්පාදන හා පරිභෝජන මෙන්ම බලශක්ති කාර්යක්ෂමතාව වැනි භාවිතාවන් එවැනි රැකියා සඳහා ඇතුළත් වේ.

**9.** ව්‍යවසාය මට්ටමේදී, හරිත රැකියා මගින් පරිසරයට ප්‍රයෝජනවත් වන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සිදු කළ හැකිය. උදාහරණයක් ලෙස, හරිත ගොඩනැගිලි හෝ පරිසර හිතකාමී ප්‍රවාහනය සැලකිය හැකිය.

**10.** වඩාත් පරිසර හිතකාමී ක්‍රියාවලීන් සඳහා හරිත රැකියා ද දායක වේ. නිදසුනක් ලෙස, ජල පරිභෝජනය අඩු කිරීම හෝ ප්‍රතිචක්‍රීකරණ පද්ධති වැඩිදියුණු කිරීම හරිත රැකියා මගින් සිදු කළ හැකිය.

**11.** හරිත රැකියා යනු මිනිසුන්ට, ආර්ථිකයට සහ පරිසරයට හිතකර රැකියා වේ.

© International Labour Organization 2023